
equitas

Centre international d'éducation aux droits humains
International Centre for Human Rights Education

# ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවන ප්‍රවර්ධනය

## උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන්




Canada

Government of Canada
Gouvernement du Canada

**ස්තුතිය**

මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරන ලද්දේ "ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවනය ප්‍රවර්ධනය" කිරීමේ ව්‍යාපෘතියේ එක් අංගයක් ලෙසිනි. මෙම සමස්ථ ව්‍යාපෘතිය Equitas ආයතනය සමඟ එක්ව ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය හවුලේ ක්‍රියාත්මක කරන ලදී.

Equitas –(**මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය**) , මෙය ලාභ නොලන අන්තර්ජාතික ආයතනයක් වන අතර සමානාත්මතාවය, සමාජ සාධාරණය සහ මානව ගරුත්වය යන කාරණා කැනඩාව තුල මෙන්ම ලෝකය තුලද අභිවර්ධනය කිරීමෙහි ලා පුරෝගාමීව කටයුතු කරන ආයතනයකි.

ICES- (**ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය**)- ස්වාධීන පර්යේෂණ ආයතනයක් වන මෙමඟින් ජනවාර්ගිකත්වය, දේශපාලන අනන්‍යතාවය සහ අර්බුද පිලිබඳ අධ්‍යයනය කරන අතර එතුලින් සැකසෙන පර්යේෂණ , ප්‍රකාශන , සංවාද, නිර්මාණාත්මක අදහස් සහ දැනුම හුවමාරුව තුලින් අන්තර්ග්‍රාහී මෙන්ම සාමකාමී සමාජයක් බිහිවීම අපේක්ෂා කරයි.

මෙහිදී උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් පිලිබඳ මෙම ප්‍රකාශනය Equitas කණ්ඩායමේ සාරා ලුස්තවුස් , වින්සෙන්සා නසාරි , ජීන් සෙබස්තියන් වැලේ සහ මිලාග්රෝස් ආර්ගිලස් යන අයගේ සුසංයෝගයෙන් එලි දැක්වුණි .

Equitas මෙහිදී සංකල්පිකරණයෙන් සහ මෙම ප්‍රකාශනය වැඩි දියුණු කිරීමට සෑම අතින්ම දායක වූ අම්පාර , කොළඹ සහ ගාල්ල කණ්ඩායම් මෙන්ම, සිවිල් සමාජ කොටස්කරුවන් , ආගමික කණ්ඩායම් , ඉරු දින පාසල් සහ රාජ්‍ය ආයතන වල නියෝජිතයන් යන සියල්ලන්ටම මෙහිදී අපි කෘතඥ පූර්වක වෙමු. .

මෙහිදී අපගේ විශේෂ ස්තුතියට පාත්‍ර වන්නේ,

- උක්ත ව්‍යාපෘතියේ පහසුකම් සැලසූ මෙන්ම පුහුණුකාරක කණ්ඩායම වන : ක්‍රිස්ටිනා ගංගා , එමිසා ටිගල් , කසුන් පතිරාජ සහ සජිද් ෆහුර්දින්
- අම්පාර කණ්ඩායම : කිතුරු මොහොමඩ් ,ඉබ්‍රා ලෙබ්බෙ හෂීම් , ඒ . එම්. මොහොමඩ් රම්සි, කාංචන කසුප් කුමාර, ෆස්ලාන් මොහොමඩ් , එම් . සාලි ජලීල් , රශාත් අහමඩ් , අරුලානන්දන් සක්තියා
- කොළඹ කණ්ඩායම : බී.ටී. චන්දන කුමාර, ජෙගන් ප්‍රකාශ් සවුන්දරරාජා, රාමනුෂා පුපාලරත්නම්, කෙත්මා කල්හාරි වික්‍රමසිංහ ,නිලූකා බණ්ඩාර , ඩී. එම්. රෝහිනී දසනායක , පූජ්‍ය එස්. සුමනරතන හිමි
- අරුන්දතී අබේපාල
- ගාලු කණ්ඩායම බී. එච් . සෝමසිරි , කින්ග්ස්ලි ලොයිඩ් එල්ටන් පියතුමන් , W.E.R. පෙරේරා , ඩියානා කුමුදුනි සිල්වා , M.F.F. ලුතුෆියා , M. F. ශාමිලා , නදින් වන්නියසිංහම් , පූජ්‍ය වැලිවිටියේ ධම්මින්ද හිමි
- Mario Gomez විසින් මෙහෙයවන ලද ICES කණ්ඩායම




පහත වෙබ් අඩවියෙන් ඉහත සිතියම භාගත කර ගත හැක.

http://www.nationsonline.org/oneworld/map/sri_lanka_map.htm

**පටුන**


| | |
|---|---|
| ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවනය ප්‍රවර්ධනය | 1 |
| ස්තුතිය | 3 |
| හැඳින්වීම | 7 |
| උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් | 10 |
| සංවාදයන් සඳහා අවකාශයන් තනා ගැනීම | 11 |
| විවිධ ප්‍රජාවන් එකම තලයකට ගෙන ඒම | 15 |
| තීරණ ගන්නවුන් සහභාගී කරවා ගැනීම | 18 |
| ළමා සහ තරුණ කණ්ඩායම් සහභාගී කරවා ගැනීම | 22 |
| මාධ්‍ය සහභාගී කරවා ගැනීම | 26 |
| අන්තර් ආගමික හමුවන් සංවිධානයට අදහස් සහ උපාය මාර්ග | 28 |
| ප්‍රජාවන් තුල සිදු කල ව්‍යාපෘතීන් හි සාරාංශයන් | 30 |

# හැඳින්වීම

<u>ප්‍රකාශනය පිළිබඳ ...</u>

මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවනය ප්‍රවර්ධනය තුලින් ඇති කරගත් මෙවලමක් ඇසුරෙන් නිර්මාණය කරන ලද්දකි . මෙමඟින් උගත් පාඩම් මෙන්ම පිළිගත් ව්‍යවහාරයන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විවිධ පාර්ශවයන් සමඟ කටයුතු කිරීමට ( උදාහරණයක් ලෙසට තීන්දු ගන්නන් , ආගමික කණ්ඩායම් , රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ කොටස්කරුවන් , ළමා සහ තරුණ කණ්ඩායම් සහ අනෙකුත් කොටස්කරුවන්) මහෝපකාරී විය .

<u>ව්‍යාපෘතිය පිළිබඳ</u> ..

ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවනය ප්‍රවර්ධනය (2014 සිට 2016 දක්වා ) ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණ වූයේ විවිධ ආගමික කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම සහ සමාජයේ එකමුතු කම මෙන්ම අන්තර් ආගමික සහජීවනය ප්‍රවර්ධනයයි.

මෙම ව්‍යාපෘතිය අම්පාර , ගාල්ල සහ කොළඹ ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් ආරම්භ කල අතර ඒ තුලින් ක්‍රියාත්මක වූ නොයෙකුත් ක්‍රියාකාරකම් හරහා අදාළ දිස්ත්‍රික්කයන් හි ආගමික සංහිඳියාව වැඩි දියුණු කිරීමට පියවර ගන්න ලදී.

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ ආගමික නිදහස පිළිබඳ සමාජ සහ නෛතික පර්යේෂණයන් සිදු කිරීම
- මානව හිමිකම් පිළිබඳ සහ ආගමික සමගිය වැඩි දියුණු කිරීම පිළිබඳ ශක්‍යතා වැඩි දියුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම
- ක්‍රියාකාරී ව්‍යාපෘති තුලින් උක්ත ප්‍රජාවන් තුනේම ආගමික සමගිය සහ සහජීවනය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම
- පර්යේෂණ එළි දැක්වීම සහ වෘත්තිකයන්ගේ සැසිය

මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය සමාජ පරිවර්තන මෙවලමක් ලෙස මානව හිමිකම් සුරැකීමේ ගෝලීය සංස්කෘතිය ඉලක්ක කොට ගෙන බිහි වූනකි. වග වීම , සහභාගිත්වය , බලගැන්වීම සහ වෙනස්කම් නොකිරීම යන මානව හිමිකම් ප්‍රවේශය එයට මඟ පෙන්වනු ලබයි. එපමණකුදු නොව මානව හිමිකම් ප්‍රවේශය, සමාජමය ක්‍රියාවන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලවද සිදු වන්නකි.

සහභාගිත්ව ප්‍රවේශය තුලින් මානව හිමිකම් ප්‍රවේශය වඩා කාර්යක්ෂමව සිදු කල හැකිය. එම (සහභාගිත්ව ප්‍රවේශය) මෙවලම තුලින් නොයෙකුත් පුද්ගලයන්ගේ මානව හිමිකම් පිළිබඳ දැනුම සහ අත්දැකීම් එකිනෙකා අතර බෙදාහදා ගැනීමට මෙන්ම පුද්ගල විශ්වාස සහ වටිනාකම් පිළිබඳ විවේචනාත්මක ප්‍රක්ෂේපනයන් සිදු කිරීමටද අවකාශයක් ලැබිණි. එනයින් ගත් කල සහභාගිත්ව ප්‍රවේශය හුදු ක්‍රියාවලියක් පමණක් නොව පුහුණු කර ගත යුතු කුසලතාවයක් බවටද පත් විණි.

ප්‍රජාවගේ සහභාගිත්වයෙන් සිදු වන ක්‍රියාකාරී ව්‍යාපෘතියක්, තෝරා ගත් ප්‍රජාවගේ ආගමික සමගිය සහ මානව හිමිකම් වෙනුවෙන් කටයුතු කරන තරුණ - මහලු , කාන්තා - පිරිමි පාර්ශව නියෝජනය වන ආගමික සහ රාජ්‍ය ආයතන සහ සිවිල් සමාජ කොටස් කරුවන් ඉලක්ක කර ගෙන කටයුතු කරයි.

**උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් පිලිබඳ නිර්වචනයන් [1]**

උගත් පාඩම් යනු යම් ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් පිලිබඳ අත්දැකීම් තුලින් ලබා ගත් අවබෝධය හෝ දැනුම වේ. මෙම අත්දැකීම් විටෙක ධනාත්මක විය හැකි අතර ( උදාහරණයක් ලෙසට සාර්ථකව සිදු කල දෘශ්‍ය සමුළුවක් ) තවත් විටෙක ඍනාත්මක ද විය හැක ( ඉලක්ක ගත කණ්ඩායම හසු කර ගත නොහැකි වුනු දැනුවත් කිරීමේ කඳවුරක්).

*පිළිගත් ව්‍යවහාරයන්* යනු මනාව ඇගයීමට ලක් කර පිටපත් කර ගන්නා ලද යහපත් බලපෑම් එල්ල කරන ලද ක්‍රියාකාරකම් වේ. නොයෙක් රටවල් වල හෝ නොයෙක් සන්දර්භයන්හි එකම අත්දැකීම් බොහෝ විට මේවාට පසුබිම් වී ඇත**.** එමෙන්ම මෙම පිළිගත් ව්‍යවහාරයන් කිහිප විටක් පර්යේෂණයට බඳුන් වී යහපත් ප්‍රතිඵල ලබා දී ඇති ක්‍රියාකාරකම් වේ. මෙම පිළිගත් ව්‍යවහාරයන් තුලට උපාය මාර්ගික ක්‍රියාකාරකම්, ක්‍රමවේදයන් සහ තාක්ෂණික හුරුව යනාදියද ඇතුලත් වේ .

**ඉලක්ක ගත කණ්ඩායම්**

මෙම ප්‍රකාශනයේ උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් සියල්ලක්ම පාහේ වෘත්තිකයන් , සිවිල් සමාජ ආයතන වල නිලදරුවන් සහ ආගමික නිදහස වෙනුවෙන් කටයුතු කරන සෙසු කොටස්කරුවන් අදහස් කරගෙන ලියන ලදී. මෙහිදී ප්‍රකාශිත උපාය මාර්ගයන්, තීරණ ගන්නවුන්ට ආගම, ජාතිය සහ මානව හිමිකම් සම්බන්ධ කරුණු විෂයයෙහි සමාජය සමඟ වඩා අර්ථවත් ව ගැටීමට මහෝපකාරී වනු ඇති බව නොඅනුමානය.

**තොරතුරු මූලාශ්‍ර**

මෙහිදී උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් වැඩිමනක්ම ආගමික සහජීවනය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ලබා ගත් අත්දැකීම් තුලින් මෙන්ම පහත ප්‍රකාශන වලින් උපයා ගත් ඒවා බව මෙහිදී කිව මනාය.

1. වෘත්තිකයන්ගේ සැසියේ සටහන්**:** 2015 නොවැම්බර් 30 පවත්වන ලද මෙම සමුළුවට සිවිල් සමාජ නියෝජිතයන් , ආගමික කණ්ඩායම් වල නියෝජිතයන් මෙන්ම අධ්‍යයන ක්ෂේත්‍රයේ පනස් දෙනෙකු පමණ සහභාගී වුහ.
2. ජාතික පර්යේෂණ එළිදැක්වීමේ සටහන්[2] : 2015 වසරේ දෙසැම්බර් පළමුවැනිදා පවත්වන්නට යෙදුනු මෙම සැසි වාරයට රාජ්‍ය නිලධාරීන් මෙන්ම නොයෙකුත් ක්ෂේත්‍ර නියෝජනය කරමින් සියදෙනෙකු පමණ සහභාගී වුහ .

[1] Definitions adapted from: www.ilo.org/ipec/programme/Designandevaluation/Goodpractices/lang--en/index.htm http://www.unep.org/eou/Pdfs/Lessons%20Learned%20rpt.pdf. Unicef, Evaluation and Lessons Learned www.unicef.org/evaluation/index_49082.html.

[2] Practitioners refer to representatives of civil society organizations (including religious organizations), government representatives and individuals who are engaged in the promotion of freedom of religion and beliefs.

3. පර්යේෂණ ප්‍රකාශන : “උග්‍ර සහ නිදන්ගත : ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සාමය තුල ආගමික ප්‍රචණ්ඩත්වය ”- ගෙහාන් ගුණතිලක . මෙය ව්‍යාපෘතියේ එක් සංරචකයකි..

4. එක් එක් දිස්ත්‍රික්කයන්හි සිදු කරන ලද ක්‍රියාකාරකම් පිලිබඳ විස්තරාත්මක වාර්තා

5. ශක්‍යතා වර්ධන වැඩමුළුවලදී සිදු කරන ලද ඇගයීම් වල ප්‍රතිඵලයන්

6.ව්‍යාපෘති කණ්ඩායමේ සහ පුහුණුකරුවන්ගේ කණ්ඩායම් වල ක්‍රියා පටිපාටින් සහ ප්‍රත්‍යාවේක්ෂණයන්

**මෙම ප්‍රකාශනයේ විශේෂ ලක්ෂණයන්**

උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් පිලිබඳ මෙම ප්‍රකාශනයෙන් දක්වා ඇති අදහස් අත්‍යන්තයෙන්ම “ශ්‍රී ලංකාවේ ආගමික සංහිදියාව ප්‍රවර්ධනය” පිලිබඳ ව්‍යාපෘතියට අදාල වේ. මෙම අදහස් මෙම ව්‍යාපෘතිය තුලින් ලබා ගත් අත්දැකීම් මත නිරපේක්ෂව පදනම් ව ඇති අතර කාලයත් සමඟ ක්‍රමයෙන් විකාශනය වනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වේ.

මෙහිදී අපගේ අත්දැකීම් බෙදා හදා ගැනීම උදෙසා උපුටාගැනීම් සහ උදාහරණයන් අප විසින් මෙම ප්‍රකාශනය තුල ගැන හැර දක්වන අතර වඩාත් අවධාරණය කල යුතු කරුණ නම් මෙම ව්‍යාපෘතියට සහභාගී වූවන්ගේ සිත් තුල මෙන්ම හදවත් තුලද මුවින් නොබිණූ තොරතුරු ඕනෑ තරම් පවතින්නට ඇති බවය.

උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් පිලිබඳ මෙම ප්‍රකාශනයේ මුඛ්‍ය පරමාර්ථය මෙමගින් යම් කිසි අදහසක් ඔබ සිත් තුලට කා වැද්දීමය. මෙම ප්‍රකාශනය කියවන පාඨක ඔබගේ සන්දර්භය පිලිබඳ හොඳ වැටහීමක් ඇත්තේ ඔබ තුලමය. එබැවින් අප විසින් යෝජිත මෙම ව්‍යවහාරයන් ඔබට උචිත මට්ටමින් හැඩගස්වා භාවිතා කිරීමේ වගකීම ඔබට භාරය.

# උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන්

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අප විසින් හඳුනා ගනු ලැබූ උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් ප්‍රධාන තේමාවන් පහක් යටතේ මෙහිදී වර්ග කර දක්වා ඇත.

1. සංවාදයන් සඳහා අවකාශය තනා ගැනීම.
2. විවධ ආගමික ප්‍රජාවන් එකම තලයකට ගෙන ඒම
3. තීරණ ගන්නවුන් සහභාගී කරවා ගැනීම
4. ළමා සහ තරුණ කණ්ඩායම් සහභාගී කරවා ගැනීම
5. මාධ්‍යය සහභාගී කරවා ගැනීම

අන්තර් ආගමික හමුවන් පවත්වා අදහස් හුවමාරු කර ගැනීමේ සමස්ථ උපාය මාර්ගික සැලැස්ම මෙම ප්‍රකාශනයේ පසුව පැහැදිලි කර ඇත.

ඉහත දක්වා ඇති සියලුම  තේමාවන් මෙම ප්‍රකාශනයේ සන්දර්භය තුල සිට හඳුන්වා දී පැහැදිලි කර ඇත. ඉන්පසු එක් එක් තේමාවන් යටතේ උගත් පාඩම් සහ පිළිගත් ව්‍යවහාරයන් හෙළිදරව් කර ඇත. අවසාන වශයෙන් පිළිගත් ව්‍ය්වහරයන්ට අදාල නිදර්ශනයක් ද මෙහි දක්වා ඇත.

මෙම ප්‍රකාශන තුල දක්වා ඇති  උගත් පාඩම් ව්‍යාපෘතියට සහභාගී වූ දිස්ත්‍රික් කණ්ඩායම් හි  ධනාත්මක සහ ඍනාත්මක අත්දැකීම් වේ. උගත් පාඩම් පිලිබඳ කොටසේදී ධනාත්මක නොවන අත්දැකීම් ඉදිරියේදී අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ද දක්වා ඇත.

## 1. සංවාදයන් සඳහා අවකාශය තනා ගැනීම.

සංවාද (Dialogue) යන වචනය සෑදී ඇත්තේ ග්‍රීක වචන වන Dia (අතරින්) සහ logos ( වචන හෝ අදහසක්) යන වචන යුගලය එකතු වීමෙනි. W. අයිසැක් මෙය අර්ථ ගන්වා ඇත්තේ " *මැදිහත් අදහසක්, සියල්ලන් සාමූහිකව සිතීමෙන් සිදු කරන සම්භාෂණයක් යනුවෙනුයි. සියල්ලන් එකතුවෙන් සිදු කරන යන්නෙන් අදහස් වන්නේ කිසිවෙකුගේ තීරණය අවසාන තීරණය නොවන බවයි. මෙහිදී ඔබ නිශ්චිතවම සිදු වන්න අතහැර, විය හැකි සම්භාවිතාවය පිලිබඳ සලකා බලයි*"[3]

මෙම ව්‍යාපෘතිය තුලින් අප ලද අත්දැකීම වූයේ විවධ ආගමික ප්‍රජාවන් අතර සංවාදයන් සිදු ව ඇත්තේ ඉතා අල්ප වශයෙන් බවයි. අප මෙය දකින්නේ ආගමික කණ්ඩයක් අතර අසහනයන් සහ ප්‍රචණ්ඩ සිදු වීම් වලක්වා ගැනීමට තිබුණු අවස්ථාවන් බොහොමයක් මෙමගින් මඟ ඇරුණු බවයි.



ප්‍රත්‍යාවේක්ෂණයට ඉඩ සැලසීම ආගමික ප්‍රජාවන් අතර සන්නිවේදනයට ඉඩ සලසයි. එමෙන්ම තම ප්‍රජාවේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමටද එය දායක වේ. ආගමික අසහනයන් සහ එහි මූල බීජයන් පිලිබඳ ප්‍රජාවන් තුල පුද්ගල අත්දැකීම් සාකච්ඡා කිරීමටත් එමගින් නිර්මාණාත්මක ප්‍රවේශයක් ලබා ගැනීමටත් එය මග හසර සලසයි. මෙබඳු නිර්මාණාත්මක සාකච්ඡා තමන් තුල අනෙකුත් ආගමික ප්‍රජාවන් ගැන ඇති දූර්මත පිලිබඳ මෙන්ම ආගමික ප්‍රජාවන්හි විවිධත්වය පිලිබඳ තම ප්‍රජාව තුල විශාල පිරිසක් වෙත සන්නිවේදනය කිරීමටද අවකාශයක් සලසයි. එමගින් තමන් හඳුනා ගැනීමට අපහසු අනෙක් ආගමික ප්‍රජාවන් ව්‍යවහාරයන් පිලිබඳ නැවත සිතා බැලීමට මෙය අවස්ථාවක් කර ගත හැක.

**උගත් පාඩම්**

ආගමික සංහිඳියාව ප්‍රවර්ධනයෙන් ප්‍රධාන වශයෙන් උගත් පාඩමක් වූයේ සංවාදයන් සඳහා අවකාශයක් සැපයීම ඵලදායි සහභාගිත්වයකට සැම විටම ඉඩ සලසන බවයි. මෙබඳු අවකාශයක් සැපයීම අනෙක් ආගමික ප්‍රජාවන් පිලිබඳ අවබෝධයක් ඇති කිරීමටද ඉවහල් වේ.

මෙම ව්‍යාපෘතිය තුල අවකාශයන් සැපයීම ආරම්භ වූයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන මට්ටමින් මෙයට සම්බන්ධ වූ වෘත්තිකයන්ගෙනි. මෙම කණ්ඩායමට අම්පාර, ගාල්ල සහ කොළඹ යන ප්‍රදේශ වලින් විවධ ආගමික කණ්ඩායම් නියෝජනය කරමින් පූජ්‍ය, පූජක, රාජ්‍ය නිලධාරී සහ සිවිල් සමාජ කොටස්කරුවන් සහභාගී වූනි.

පහත දක්වා ඇති පාඩම් මගින් උක්ත ප්‍රතිඵල ලබා ගැනීමට ගන්නා ලද උපාය මාර්ග පහදා ඇත.

**ඉලක්ක ගත කණ්ඩායම් වල සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භය අවබෝධ කර ගැනීම** වෘත්තිකයන් තුල විශ්වාසය වැඩි කරනවා පමණක් නොව වඩාත්ම සුදුසු ක්‍රියාකාරකම් මොනවාදැයි තෝරා බේරා ක්‍රියාත්මක කිරීමට ද පොළඹවයි.

[3] Isaacs, W. (1999). Dialogue and the Art of Thinking Together. Doubleday: New York. page 19.

මානව හිමිකම් සන්දර්භය තුල මුල් බැස ගත් **සහභාගිත්ව ප්‍රවේශය** පහත අවස්ථාවන් සඳහා උපස්තම්භ වේ.

- ප්‍රජාවන්ගේ අභිලාෂයන් කුමක්දැයි දැනගෙන වඩාත් ඵලදායි ලෙස කටයුතු කිරීමට හැකි වීම
- මානව හිමිකම් ගැටළු කුමක්දැයි වඩා විචාරාත්මකව විශ්ලේෂණය කොට ඒ සඳහා සුදුසු උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම
- ආගම, ජාතිය සහ ආර්ථික සහ සමාජය බෙදීම් ඉක්මවා ගොස් වඩා විවිධත්වයකින් යුතු කණ්ඩායමක් සමඟින් කටයුතු කිරීම
- ගාල්ල, කොළඹ සහ අම්පාර පුහුණු කරවන්නන් ඉක්මනින්ම අවබෝධ කර ගත් කරුණක් වූයේ මානව හිමිකම් සහ ආගමික සංහිඳියාව පිලිබඳ සහභාගී වන්නන් උනන්දු කරවීමට නම් එයට වඩා විනෝද ජනක සහ තැති නොගන්වන ක්‍රියාකාරකම් සිදු කල යුතු බවයි. එම නිසාම බොහොමයක් හමු වීම් සිදු කරන ලද්දේ මෙම ආගමික කණ්ඩායම්හි සංස්කෘතික උත්සව සහ ආගමික උත්සව පැවැත්වෙන අවස්ථාවන් වලදීය. මේ අයුරින් සිදු කරන ලද සහභාගිත්ව පර්යේෂණ ක්‍රියාවලිය පුද්ගල දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගෙන එමගින් අන් සාමාජිකයන්ගේ විශ්වාසයන් සහ වටිනාකම් පිලිබඳ නැවත සිතා බැලීමට අවස්ථාවක් සියල්ලන්ටම ලබා දෙන ලදී.

**මානව හිමිකම් ප්‍රවේශය** යටතේ බොහොමයක් ගැටුම් ඇති කරවන ප්‍රශ්න විසඳීමට ක්‍රම දේශීය නීති පද්ධතිය යටතේ ක්‍රියා කිරීමට උත්සහ කිරීම තුලින් බොහොමයක් ගැටළු පුද්ගලයන්ය නොකර ව්‍යසනයකට පත් නොවී විසඳා ගැනීමට හැකි වුනි.

සංවාදයන් සඳහා අවකාශයන් තනා ගැනීමට කාලය වටිනා මෙවලමකි. එහෙත් ක්‍රියාවලිය ගලා යන ක්‍රමය ඉක්මන් කරවීමට උත්සාහ කිරීම සැමවිටම ඵලදායි නොවිය හැක.

**පිළිගත් ව්‍යවහාරයන්**

මෙම ව්‍යාපෘතිය පුරාවටම ඉගෙනුම් ක්‍රියාවලියට ආරක්ෂිත අවකාශයක් තනා දීමට සංවාදය සහ ප්‍රත්‍යවේක්ෂණය සිදු කල අතර එමගින් පුහුණුකරුවන්ට :

ඉලක්ක ගත කණ්ඩායම් වල සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන සන්දර්භය අවබෝධ කර ගැනීමට හැකි වුනි.

සහභාගිත්ව ප්‍රවේශය යටතේ තමන් ලද අත්දැකීම් මත මානව හිමිකම් වලට අදාළ ගැටළු විචාරාත්මකව විශ්ලේෂණය කොට එමගින් නිර්ණය කරන ලද ප්‍රතිඵල අත්පත් කරගැනීමට උපාය මාර්ගයන් අනුගමනය කල හැකි විය.

මානව හිමිකම් ප්‍රවේශය යටතේ බොහොමයක් ගැටළු පුදගලායනය නොකර විසඳා ගැනීමට ඉඩ සැලසිණි.

**සංවාදයන් සඳහා අවකාශයක් තනා ගැනීම**

**පිළිගත් ව්‍යවහාරයන් සඳහා උදාහරණ**

දහම් පාසල් වල සිදු කරන ලද ක්‍රියාකාරකම් වලදී කොළඹ කණ්ඩායම සහභාගිත්ව ප්‍රවේශය භාවිතා කරන ලදී. ඒවා අතර ,

- තමන් ලද අත්දැකීම් ඇසුරෙන් වඩා හිතකර ඉගෙනුම් ක්‍රියාවලියකට සහ සුරක්ෂිත සංවාදයක් සඳහා අවකාශයක් තනා ගැනීමට කණ්ඩායම් මාර්ගෝපදේශනයන් පිළියෙළ කිරීම. මෙම මාර්ගෝපදේශනයන් අතරට,
    - අනෙකා කියන දෙයට සවන් දීම.
    - සහභාගිත්වය තුලින් අනෙකා අදහස් වලට 100% ගරු කිරීම.
    - ක්‍රියාකාරකම් අතරතුරදී ජංගම දුරකථන විසන්ධි කිරීම.
    - අන් අයෙකුගේ සේයාරූ ගන්නේ නම් එයට අදාළ පුද්ගලයාගේ ලිඛිත අවසරය ලබා ගැනීම සහ ඒවා අන්තර්ජාලයේ සහ ප්‍රකාශනයන්හි සුදුසු පරිද්දෙන් බෙදා හදා ගැනීම.
- සහභාගිවන්නන්ට අන් අය සමඟ කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම, ඔවුනොවුන්ගේ හැකියාවන් මෙන්ම දුර්වලතා අවබෝධ කර ගැනීම සහ එමගින් වඩා ඵලදායි කණ්ඩායම් ක්‍රියාවලියකට යොමු කරවීම.
- පහසුකම් සපයන්නෙකු/ පුහුණුකරුවෙකු වශයෙන් තම කණ්ඩායම මෙම ක්‍රියාවලිය තුල ඉදිරියට ගමන් කරවීම සහ කාලය සහ අවකාශය තුලින් ඔවුන්ගේ අත්දැකීම් සහ ප්‍රත්‍යවේක්ෂණයන් බෙදා හදා ගැනීමට යොමු කරවීම.



## 2. විවධ ආගමික ප්‍රජාවන් එකම තලයකට ගෙන ඒම

"*මෙම වැඩසටහන මඟින් මට අනෙකුත් ආගම් වල පුද්ගලයන්ට මාව හඳුන්වා දීමට අවස්ථාව ලැබුණා. අපි මින් පෙර සීමා සහිත ඉඩකයි හිටියේ. එහෙත් දැන් අපට එකතු වී වැඩ කල හැකියි. කලින් අපි තනි තනිව හිටියත් දැන් අපට ජාල ගතව වැඩ කල හැකියි. මෙය අපේ අනාගතය වෙනුවෙන් ගත් යහපත් පියවරක්*"

පාසල් විදුහල්පතිවරයෙක් , කොළඹ වැඩමුළුවට සහභාගිවූවෙක්

මෙය අපට හමුවූ එක් ස්වයං-ප්‍රත්‍යක්ෂ සිදුවීමකි. එහෙත් විවිධ ආගමික කණ්ඩායම් වල පුද්ගලයන් එක තලයකට ගෙන ඒම සැමවිටම පහසු කටයුත්තක් නොවේ. විශේෂයෙන්ම ලංකාව වැනි රටක විවධ ආගමික කණ්ඩායම් වල පුද්ගලයන් අනෙක් ආගමික කණ්ඩායම් වෙත අර්ථවත් ලෙස වැඩි වශයෙන් නිරාවරණය වී නැත.

**උගත් පාඩම්**

සන්නිවේදනය සඳහා අවකාශය තනා ගැනීමට සහ එකිනෙකා අතර අවබෝධය වැඩි දියුණු කර ගැනීමට විවිධ ආගම් නියෝජනය කරන ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරන ලදී.

- අනෙකාට ගරු කිරීම වැදගත්ය. එමෙන්ම අනෙකුත් ආගමික වත්පිළිවෙත් පිලිබඳ දැනසිටීමද ඒවා අගය කිරීමද වැදගත්ය.
- එක් එක් ආගම් අභ්‍යන්තරයේ ඇති වෙනස්කම් අවබෝධ කර ගැනීමද අන්තර් - ආගමික සහජීවනය වැඩි දියුණු කිරීමට මහෝපකාරී වේ.
- ආගමික ප්‍රජාවන් අතර අවබෝධය වැඩි කිරීමද අවිශ්වාසය නැති කිරීමේ ක්‍රමවේදයකි.
- සබඳතාවන් ඇති කර ගැනීම, විශේෂයන්ම අන්තර්- ආගමික සම්බන්දතා ඇති කර ගැනීම කාලයක් ගත වන කටයුත්තකි.



**පිළිගත් ව්‍යවහාරයන්**

විවිධ ආගමික ප්‍රජාවන් එකම තලයකට ගෙන ඒම සඳහා පහත කරුණු වැදගත් වේ.

- විවධ ආගමික ප්‍රජාවන්ට හමු වීමට, සංවාදයේ යෙදීමට සහ සම්බන්ධතා ගොඩ නගා ගැනීමට අවස්ථාවන් සලසා දීම.
- විවධ ආගමික ප්‍රජාවන් මුණ ගැසීමට පෙර එක් එක් ප්‍රජාවන්ට ඒ සඳහා සූදානම් වීමට යම් කිසි කාලයක් ලබා දීම. මෙම යම් කාලයක් ලබා දීම යන්නෙන් අදහස් වන්නේ අනෙකුත් ප්‍රජාවන් සමඟ සුහදව කටයුතු කිරීමට ධනාත්මක මනසකින් යුතුව සූදානම්ව පැමිණීමට ඉඩ ලබා දීමයි.
- මෙම ක්‍රියාදාමයට සහාය පල කරතැයි සිතිය හැකි ආගමික නායකයන් පෞද්ගලිකව මුණ ගැසී, සාකච්ඡා කර ඔවුන්වද මෙම ව්‍යාපෘතියට සම්බන්ධ කරගැනීම.
- සියලුම ආගමික ප්‍රජාවන් අතර අනෙක් ආගම් පිලිබඳ අවබෝධය සහ එම ආගම් වලට අනන්‍ය වූ වත්පිළිවෙත් පිලිබඳ යම් කිසි අදහසක් ලබා දීම.

**විවධ ආගමික ප්‍රජාවන් එකම තලයකට ගෙන ඒම**

**පිළිගත් ව්‍යවහාරයන් සඳහා උදාහරණ**

එකිනෙකා හමුව, සංවාදයේ යෙදී සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ගාලු කණ්ඩායම ගත් ක්‍රියාමාර්ග මෙයට කදිම උදාහරණයකි.

ගාලු කණ්ඩායම අවස්ථාවන් ගණනාවකදී විවධ ආගමික ප්‍රජාවන් හමුවීම සඳහා ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරන ලදී. මෙම ක්‍රියාකාරකම් අතරට, වරකදී සියලුම ආගම් නියෝජනය කරන කණ්ඩායම් ආගමික, පූජනිය ස්ථාන නැරඹීමට ගෙන යාම උදාහරණයක් ලෙස දැක්විය හැක. උක්ත ක්‍රියාකාරකමට සහභාගී වූ අයෙකු ඒ ගැන කල සඳහනක් පහත දැක්වේ.




"*මම ජීවිතයේ පළමු වරට පන්සලක් තුලට ගියා. බයිබලය ගැන ඉගෙන ගත්තා. විවධ ආගමික උත්සව පිලිබඳ හැඳෑරුවා. අනෙකුත් ආගම් වලට අයත් වන පුද්ගලයන් සමඟ මම එකට වැඩි වෙලා හිටියා.*"

මෙහිදී කණ්ඩායම් අවබෝධ කරගත් කරුණක් වුයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් ඒ සඳහා අවශ්‍ය කාලය ලබා දිය යුතු බවය. මෙහිදී උක්ත ක්‍රියාවලින් සඳහා සහභාගී වීමට අපේක්ෂිත පුද්ගලයන් හඳුනා ගෙන කණ්ඩායම් හමු වීම් වලට ප්‍රථමයෙන් ඔවුන් පුද්ගලිකව මුණ ගැසී කතාබස් කර ඔවුන්ගේ උනන්දුව වැඩි දියුණු කරවීමට උත්සහ ගන්නා ලදී. මෙය කාලය අතිශයින් වැය වන කටයුත්තක් වුවද මෙම ක්‍රියාවලිය අවසානයේදී ප්‍රධාන ආගම් හතරම නියෝජනය වන පරිද්දෙන් පුද්ගලයන් 53 දෙනෙකු කණ්ඩායමට සහභාගී වී තිබුණි.

## 3. තීරණ ගන්නවුන් සහභාගී කරවා ගැනීම

මෙහිදී තීරණ ගන්නවුන් වශයෙන් සලකා බැලුවේ ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය පිලිබඳ තීන්දු තීරණ ගැනීමේ බලයක් ඇති විවිධ තරාතිරමේ පුද්ගලයන්ය. මෙහිදී තීරණ ගන්නවුන් ලෙස ඡන්දයෙන් පත් වුනු මහජන නියෝජිතයන්, ආයතන ප්‍රධානීන් ( රාජ්‍ය නොවන සංවිධාන වල, පාසල් වල), රාජ්‍ය ආයතන වල ප්‍රධානීන් සහ ආගමික නායකයන් අයත් විණි.

මෙහිදී අවධාරණය කල යුතු ප්‍රධානම දෙය නම් තීරණ ගන්නවුන් මෙම ව්‍යාපෘතියට  සම්බන්ධ කර ගැනීම අපට මුල සිටම දැවැන්ත අභියෝගයක් වුනු බවයි. මෙහිදී එබඳු තීරණ ගන්නවුන් සමඟ කටයුතු කිරීම සහ එවැනි කටයුත්තකට වැඩි කාලයක් ගත වීමද ගැටළුවක් විණි. සමහර ආගමික ප්‍රජාවන් තුල මෙබඳු තීරණ ගන්නවුන් පිලිබඳ වැඩි ප්‍රසාදයක් නොමැති නිසාම තීරණ ගන්නවුන් තුල මෙම ව්‍යාපෘතියට දායක වීම පිලිබඳ තිබුනේ නොපහන් ආකල්පයකි. මෙබඳු බාධා කොතරම් පැවතියද පුහුණුකරුවන් කණ්ඩායම විවධ තලයේ තීරණ ගන්නවුන් ව්‍යාපෘතියට සම්බන්ධ කර ගැනීමට සමත් වුනි. උදාහරණයක් ලෙස අම්පාර කණ්ඩායම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ මට්ටමේ නිලදරුවන් සහ ආගමික නායකයන් මෙයට සම්බන්ධ කර ගත් අතර කොළඹ කණ්ඩායම ඉරු දින පාසල් වල ප්‍රධානීන් මෙයට දායක කර ගත්හ.

**උගත් පාඩම්**

පහත අප උගත් පාඩම් ලෙස දක්වා ඇත්තේ තීරණ ගන්නවුන් සම්බන්ධ කර ගැනීමේදී සැලකිය යුතු අදහස් කිහිපයක් පිලිබඳවය.

- ‘කවුරු තෝරා ගත යුතුද යන්න’ මෙහිදී ව්‍යාපෘතියේ සාර්ථකත්වය තීරණය කරන සාධකයකි. ඔවුන් සමඟ සාර්ථක ලෙස කටයුතු කිරීමට නම්
  - **සන්දර්භ විශ්ලේෂණයක්** තුලින් දිස්ත්‍රික් මට්ටමින් තීරණ ගන්නවුන් හඳුනා ගෙන වඩාත් නිවැරදි පුද්ගලයන් හා සම්බන්ධ විය යුතුය.
  - පළමුව ඔවුන් සම්බන්ධ කර ගත් පසු නැවත ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට ඔවුනට **ප්‍රමාණවත් කාලයක්** ලබා දිය යුතුය.
  - තීරණ ගන්නවුන් මුලින්ම හමුවීමට තමන් දැනට **දන්නා පුද්ගලයන් සහ ජාලයන්ගේ උපදෙස්** සහ සහය ලබා ගැනීම වැදගත්ය.
- ප්‍රජාව, රාජ්‍ය සහ ආගමික මට්ටමේ තීරණ ගන්නවුන්, ව්‍යාපෘතිය ආරම්භයේ සිටම සම්බන්ධ කර ගැනීම ව්‍යාපෘතිය අවසානයේදී ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලබා දීමට හේතුවේ.පහත දක්වා ඇති කරුණු තීරණ ගන්නවුන්ගේ ධනාත්මක මැදිහත් වීමකට හේතු කාරණා වේ. සැබවින්ම බලන කල ව්‍යාපෘතිය පිලිබඳ උද්යෝගිමත් ‘තීරණ ගන්නෙක්’ අනිවාර්යෙන්ම මෙම ව්‍යාපෘතිය අදාල ප්‍රජාව තුල ප්‍රවර්ධනයට නිතැතින්ම දායක වේ.
  - ව්‍යාපෘතියේ ඉලක්කය සහ තීරණ ගන්නන්ගේ කාර්ය භාරය අතර සම්බන්ධතාවයක් ඇති කිරීම, ව්‍යාපෘතිය තුල ඔවුන්ගේ බැඳීම තහවුරු කිරීමට හේතු වේ.
  - ආරම්භයේ සිටම තීරණ ගන්නන්ගේ නිලය සහ අත්දැකීම් පිළිගැනිම ද ව්‍යාපෘතිය පිලිබඳ ඔබගේ අභිප්‍රාය තහවුරු වීමට හේතු වේ.

- තීරණ ගන්නන්ට ව්‍යාපෘතිය තුල ඔවුන්ට  සහභාගී විය හැකි ශක්‍යතාවයන් මොනවා දැයි හඳුන්වා දීම , මෙම ව්‍යාපෘතිය තුල තමන්ට සහභාගී විය හැකි වපසරිය කුමක්දැයි තෝරා ගැනීමට ඉඩ සලසයි.
- ව්‍යාපෘතියේ විවිධ පියවරයන්හිදී තීරණ ගන්නන් සමඟ එක් වී පසු විපරමක් සිදු කිරීම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව නොකඩවා පවත්වා ගැනීමට හේතු වේ.
- තීරණ ගන්නන් සමඟ සම්බන්ධ වීමට පෙර ඒ පිලිබඳ දැඩිව එල්බ ගත් බලාපොරොත්තු/සිතිවිලි රහිතව යාම තීරණ ගන්නන් සමඟ කටයුතු කිරීමට පහසුවකි.

**පිළිගත් ව්‍යවහාරයන්**

තීරණ ගන්නන් ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ කර ගැනීමට පහත කරුණු වැදගත් වේ.

- තීරණ ගන්නන් හමුවන මුල්ම අවස්ථාවේදීම තමන් සහ ව්‍යාපෘතිය පිලිබඳ හඳුන්වා දීමක් සිදු කිරීම වැදගත්ය.
- තීරණ ගන්නන් සමඟ සම්බන්ධ වීමේදී ජාතික තලයේ පුද්ගලයන් තෝරා ගැනීමේ හැකියාවක් පවතී නම් එය වැදගත්ය.උදාහරණයක් ලෙසට අම්පාර කණ්ඩායම වෙත අම්පර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් හමුවීමට ලිපියක් ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (ICES) විසින් නිකුත් කර තිබුණි.



- තීරණ ගන්නන්ට ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දිය හැක්කේ මොනවා දැයි සොයා බලා ඒ සඳහා ඔවුන්ට විකල්ප ලබා දීම.
- ව්‍යාපෘතිය මුල සිට අවසානය තෙක්ම තීරණ ගන්නන්ව  සහභාගිත්වයට උනන්දු කරවීම.
- තීරණ ගන්නන් ව්‍යාපෘතිය කෙරෙහි සහභාගී වීමට උනන්දු වන විවිධ සාධක හඳුනා ගෙන (උදා:කාලය, උපයෝජ්‍යතාවය සහ දේශපාලන ජනවරම ) ඒ එකිනෙකට විවධ ප්‍රවේශයන් ලබා ගත යුතු වේ.

**තීරණ ගන්නවුන් සහභාගී කරවා ගැනීම**

**පිළිගත් ව්‍යවහාරයන් සඳහා උදාහරණ**

ව්‍යාපෘතිය ආරම්භයේ සිට දිගටම, අම්පාර කණ්ඩායම ආගමික ගැටුම් නිරාකරණයෙහි ලා විවිධ තලයේ බහු විධ තීරණ  ගන්නන් සහභාගී කරවා ගැනීමේ අවශ්‍යතාවය දැන සිටියහ.

මෙහිදී ආගමික සහ ප්‍රජා මූලික ආයතන වල නායකයන් ව්‍යාපෘතිය මුළුල්ලේම ස්ව දායකත්වය ලබා දීම කැපී පෙනෙන කරුණකි. මෙහිදී කණ්ඩායම, කේවල/ සමූහ හමුවීම් තුලින් සහ අවිධිමත් සාකච්ඡා හරහා මෙම නායකයන් සමඟ කටයුතු කර, ඔවුන්ගේ ශක්‍යතාවයන් අවබෝධ කරගෙන ඔවුන් සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන ලදී.

රජය සමඟ කටයුතු කිරීමේදී පරිපාලන ව්‍යුහයේ ධුරාවලියද අධ්‍යයනය කරන ලදී. මෙහිදී කණ්ඩායම පළමුව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ මට්ටමේ නිලධාරීන්[4] සමඟ සම්බන්ධ වුනු අතර ඉනික්බිත්තෙන් මෙම නිලධාරීන් ඔවුන්ව රාජ්‍ය ධුරාවලියේ ඉහල තල වෙත යොමු කරන ලදී. මෙමගින් පරිපාලන ව්‍යුහය තුල බොහෝ දෙනෙක් මෙම ව්‍යාපෘතිය සහ එහි කාර්ය භාරය පිලිබඳ බොහෝ දේ දැනගත්හ.

මෙහිදී ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්, ප්‍රාදේශීය මට්ටමේ සිට ( ප්‍රජා මූලික ක්‍රියාකාරකම්) ජාතික තලය තෙක් (වෘත්තිකයන්ගේ සැසි) ඉදිරියට යද්දී රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයද ඒ අයුරින් ඉදිරියට ගෙන යන ලදී. වෘත්තිකයන්ගේ සැසිවාරයන්හිදී දිස්ත්‍රික් ලේකම් කොට්ටාශ මට්ටමින් නිලධාරීන් සම්බන්ධ කර ගැනුණු අතර ඔවුන්ව ව්‍යාපෘතියේ ඉදිරි පියවරයන් පිලිබඳ දැනුවත් කරන ලදී. එමඟින් දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ට මෙම ව්‍යාපෘතියේ වැදගත්කම පිලිබඳ අදහසක් ලැබුණු අතරම තමන්ගේ කාර්ය භාරය කුමක් විය යුතුද යන්න පිළිබඳවද අදහසක් ලැබුණි. ඒ අනුව අවසාන ක්‍රියාකාරකම සඳහා ඔවුහු සියලු දෙනා සහභාගී වුණු අතරම එමඟින් බහු විධ කොටස්කරුවන්ගෙන් සැදුණු කණ්ඩායමක් මඟින් ගැටළු අර්බුද බවට පත් නොවී විසඳා ගැනීමට මඟ සැලසිණි.

[4] සංවර්ධන නිලධාරීන්, සංස්කෘතික නිලධාරීන්, ඉඩම් නිලධාරීන්

## 4. ළමා සහ තරුණ කණ්ඩායම් සහභාගී කරවා ගැනීම

*එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය* (1990) ළමුන් සහ තරුණ කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමේ ඵලදායි ක්‍රම සහ ඒ පිළිබඳ අවබෝධයක් ලබා දී ඇත. මේවා අතරට වඩාත් හොඳින් සවන් දීම[5], උපදේශනමය ක්‍රියාවලි සහ ළමුන් සහ තරුණ කණ්ඩායම් ක්‍රියාකාරී සාමාජිකයන් වශයෙන් සම්බන්ධ කර ගැනීම යනාදිය අයත් වේ.

ළමුන් සහ තරුණ කණ්ඩායම් වඩාත් අර්ථවත් ලෙස මේවාට සම්බන්ධ කර ගැනීම, ඔවුන්ගේ ඉදිරි වර්ධනයට සහ සංවර්ධනයට අත්‍යන්තයෙන්ම වැදගත් වේ. ඔවුන්ගේ මෙම දායකත්වය හරහා පුද්ගලික වර්ධනය මෙන්ම ප්‍රජාවේ සමෘද්ධියද සාක්ෂාත් වේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය තුල ඔවුන්ගේ විශ්වාසය, ජීවන කුසලතා සහ ස්වේච්ඡා කටයුතු පිළිබඳ ඇගයීමක්ද බලාපොරොත්තු විය හැක.




**උගත් පාඩම්**

ව්‍යාපෘතිය කර ගෙන යාමේදී පහත කරුණු ළමා සහ තරුණ කණ්ඩායම් සහභාගී කරවා ගැනීම සාර්ථක කරවීමට හේතු විය.

- ළමුන් සහ තරුණ කණ්ඩායම් වල අදහස් වලට සවන් දීමට අවස්ථාවන් සලසා දීම. කොළඹ සහ ගාලු කණ්ඩායම් සිදු කරන ලද ක්‍රියාකාරකම් වලදී මෙබඳු අයුරින් නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට තරුණ සහ ළමා කණ්ඩායම් වලට හැකි විණි.
- සංස්කෘතික වශයෙන් අපක්ෂපාති ස්ථාන වල ක්‍රියාකාරකම් සිදු කිරීම.
- වයසට ගැලපෙන අයුරින් ක්‍රියාකාරකම් සිදු කිරීම.
- තෝරා ගත් එකම කණ්ඩායමක් සමඟ කාලයක් වැඩ කිරීම.
- නිශ්චිත ආකෘතියක් තෝරා ගෙන ඒ අනුව වැඩ කිරීම. කොළඹ ඉලක්ක ගත කණ්ඩායම ලෙස තෝරා ගනු ලැබුවේ ඉරු දින පාසල් වල සිසු දරුවන්වය. එම පාසල් වල විදුහල්පතිවරුන්ගේ අවසරය ලබා ගැනීම මෙම කටයුත්ත පහසු කරවීමට හේතු විණි.
- දෘශ්‍ය මාධ්‍ය සහ සංස්කෘතික වැඩසටහන් මෙයට හේතු වුනු තවත් කරුණකි.
- මෙහිදී ළමුන්ට වටිනාකම්, යුතුකම් සහ අයිතිවාසිකම් පිළිබඳ, අනෙක් ආගම් වලට ගරු කිරීම, ඉවසීම සහ වෙනස්කම් නොකිරීම පිළිබඳ උගැන්වීම.
- ළමා සහ තරුණ කණ්ඩායම් තනි කොටසක් නොව වෙන වෙනම ගෙන සැලකීම.
- ළමුන්ව වඩාත් ඵලදායි ලෙස සහභාගී කරවා ගැනීමට සුදුසු මෙවලම් ලබා දීම. උදා: තොරතුරු, අධ්‍යාපනය සහ පුරවැසි හිමිකම්

[5] ඇහුම්කන් දෙනවාට වඩා (හුදු ශබ්දයකට), අවබෝධයෙන් යුතුව සවන්දීම මෙයට අදාළ වේ.

- සම්බන්ධ කරගැනීමට සුදුසු ව්‍යුහයන් හඳුනා ගැනීම . උදා: තරුණ සමාජ, යොවුන් පාර්ලමේන්තුව

**පිළිගත් ව්‍යවහාරයන්**

ළමා සහ තරුණ කණ්ඩායම් සමඟ ඵලදායි ලෙස සම්බන්ධ වීමට නම්,

- විධිමත් සහ අවිධිමත් අධ්‍යාපන පද්ධතීන්ට අදාළ සියලුම ගුරුවරුන්ට සාරධර්ම පිලිබඳ විෂය, යුතුකම් සහ වගකීම් පිලිබඳ විෂයයන් හඳුන්වා දීම. (උදා: ඉරු දින පාසල්) මෙමගින් ගුරුවරු සහ ළමයින්ට අනෙක් ආගම්වල මත ඉවසීම යනාදී කාරණා සංවාදයට භාජනය කිරීමට ඉඩ සැලසිණි. එමෙන්ම උක්ත කරුණු පිලිබඳ සංවාදයට නිශ්චිත රාමුවක සිට සුදුසු භාෂාවක් භාවිතා කිරීම ගැනද සැලකිල්ලට ගනු ලැබිණි.
- අභිමානය, ඉවසීම සහ සමානතාවය පිලිබඳ කරුණු පිලිබඳ සාකච්ඡා කිරීම.
- තරුණයන්ව තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම සහ සමාජ ක්‍රියාකාරකම් තුලින් ප්‍රජාවගේ කටයුතු වලට ඔවුන්ව නිර්මාණාත්මක ලෙස දායක කර ගැනීම.



නායකත්වය පිලිබඳ අත්දැකීම්, මනුෂ්‍ය වටිනාකම් පිලිබඳ අත්දැකීම් පැහැදිලිව පල කිරීමට ඇති හැකියාව, විවිධ ආගම් පිලිබඳ ඇති දැනුම සහ එමඟින් එකිනෙකා අතර ඇති සැකය දුරු කිරීමට හැකි වීම සහ අනෙක් ආගම් ප්‍රජාවන්ගේ තරුණ කණ්ඩායම් සමඟ එකට ගැටී කටයුතු කිරීමට හැකි වීම යනාදී කරුණු තරුණ නායකත්වයක් ඇති කිරීමට සහ එමඟින් ආගමික අසහනයට නිර්මාණාත්මක ලෙස පිළිතුරු දිය හැකි හේතු කාරණාය.

**ළමා සහ තරුණ කණ්ඩායම් සහභාගී කරවා ගැනීම**

**පිළිගත් ව්‍යවහාරයන් සඳහා උදාහරණ**

**ගැටලුව**

කොළඹ කණ්ඩායම අනාවරණය කර ගත් කරුණක් වුයේ එක් එක් ආගම් පිලිබඳ සහ ඒ ඒ ආගම් වල වත් පිළිවෙත් පිලිබඳ ඇති අනවබෝධය, ප්‍රජාවන් අතර ගැටුම් වලට හේතුවක් බවයි.

**විසඳීමට ගත් ක්‍රියා මාර්ග**

මෙහිදී කණ්ඩායම උක්ත ගැටලුව විසඳීමට උපාය මාර්ගික පිවිසුම් ප්‍රවේශය ලෙස තෝරා ගනු ලැබුවේ ඉරු දින දහම් පාසල් වල ඉගෙනුම ලබා සිසුන්ය. මෙහිදී අලුතින් ලබා ගත් මානව හිමිකම් පිලිබඳ දැනුම සහ 'Play it fair' උපකරණ කට්ටලය[6] ආධාරයෙන් ඉරු දින පාසල් හතරක ගුරුවරුන් 22 දෙනෙකුට මානව හිමිකම් වටිනාකම් පිලිබඳ උගැන්වීමට හැකි විණි.

මෙහිදී මෙම ගුරුවරුන් මෙම උපකරණ කට්ටලය පන්ති කාමරය තුල භාවිතා කල යුත්තේ කෙසේදැයි උගෙන ගත් අතර සිසුන් විවිධ මානව පරිසර තත්ත්ව යටතේ ගැටුම් වැළක්වීමේ ක්‍රමෝපායන් උගෙන ගත්හ. මෙහිදී මානව වටිනා කම් ඇසුරෙන් (උදා: එකිනෙකාට ගරු කිරීම ) විවධ ආගමික ප්‍රජාවන් අතර අවබෝධය කෙසේ ඇති කරන්නේදැයි යන්න අවබෝධ කර ගැනීමට ඔවුන්ට හැකි විණි.

**ප්‍රතිඵල**

සහභාගී වූ බොහෝ දෙනෙකුගෙන් මේ පිලිබඳ ලැබුණු ප්‍රතිචාර ධනාත්මක ඒවාය. ළමෝ මානව සාරධර්ම පිලිබඳ එමගින් ඉගෙන ගත් අතර ( ගරු කිරීම, පිළිගැනීම, අන්තර්ග්‍රාහී වීම, සහයෝගය, විවිධත්වයට ගරු කිරීම , සාධාරණත්වය, වගකීම) එමගින් ප්‍රජාවන් අතර අවබෝධය කෙසේ වැඩි වන්නේදැයි උගත්හ.

මෙයට සමගාමීව ගුරුවරුන්ද අන්තර්-ආගමික ගැටුම් පිලිබඳ නව දැනුමක් විනෝදාත්මක මුහුණුවරකින් ලබා ගත් බව පෙනෙන්නට තිබුණි. එක් ඉරු දින පාසල් ගුරුවරයෙක් මේ පිලිබඳ දැක්වූ අදහස් පහත පරිදි වේ.

" *අප මේ දක්වා සැම දෙයක්ම ඉගැන්වුවේ අපේ ආගමික රාමුවේ සිටයි. දැන් අපිට එකිනෙකා අතර සන්නිවේදනයට පසුබිමක් වගේම එක් එක් ආගම් අතර බැඳීමක් ද පවතිනවා. දැන් අපට මෙ යහපත් පණිවිඩය අපේ දරුවන්ටද ලබා දෙන්නට පුළුවන්.*"

[6] Play it fair ළමුන්ට මානව හිමිකම් පිලිබඳ ක්‍රියාකාරකම් ඇසුරෙන් ඉගැන්වීමට හැකි උපකරණ කට්ටලයකි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මෙම උපකරණ කට්ටලය සිංහලට සහ දමිළ භාෂාවට පරිවර්තනය කරනු ලැබිණි.

## 5. මාධ්‍යය සහභාගී කරවා ගැනීම

මහ ජනතාවට දැනුම වෙත ඍජු ප්‍රවේශයන් නොමැති අවස්ථාවන් වලදී ලොව සිදු වන තතු එලෙසින් ඔවුන් අභියසට ගෙන යාමට මාධ්‍යය වෙත පැවරෙන්නේ බරපතල කාර්ය භාරයකි. මෙම ව්‍යාපෘතිය පිලිබඳ තතු ශ්‍රී ලාංකේය ජනතාව වෙත ගෙන යාමට ව්‍යාපෘතියට දායක වූ සියලු දෙනාට මාධ්‍ය ( සාම්ප්‍රදායික සහ සමාජ ජාලා) හා සම්බන්ධ වීමට උනන්දු කරනු ලැබිණි.

කොළඹ, ගාල්ල සහ අම්පාර කණ්ඩායම් සියල්ලම සාම්ප්‍රදායික මාධ්‍ය ( පුවත්පත් ) භාවිතා කල අතර එයට සමගාමීව ෆේස්බුක් භාවිතාවද දක්නට ලැබිණි.

**උගත් පාඩම්**

මාධ්‍ය භාවිතයෙන් පුළුල් වපසරියක මහජනතාව දැනුවත් කිරීමට පහත දැ උගත් පාඩම් ලෙස දැක්විය හැක.

- ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍ය නොමැති විටදී සහ ඔවුන් පක්ෂපාති වන අවස්ථාවලදී ‘සමාජ ජාල’’ භාවිත කිරීම තුලින් මහ ජනතාව වෙත ඉක්මනින් සහ පහසුවෙන් සම්බන්ධ විය හැක. එහෙත් මෙහිදී අප විසින් අවබෝධ කර ගත යුතු කරුණ නම් සමාජ ජාල පුද්ගලයන් දැනුවත් කිරීමට භාවිතා කරනවා මෙන්ම එය තුලින් දූෂමාන ආරංචි/ කට කතා ද පහසුවෙන් පැතිර යන බවයි.
- මෙහිදී එක් එක් කණ්ඩායම් වලට ෆේස්බුක් භාවිතා කිරීම තුලින් මහ ජනතාව වෙත ප්‍රවේශ වීමට ඉඩ කඩ ලබා දුන්නද බාහිර පාර්ශවයන් ඒ සඳහා දක්වන ප්‍රතිචාර පිළිබඳවද නිරන්තරයෙන්ම අවධානය යොමු කෙරිණි.
- වාර්තාවක් හෝ මාධ්‍ය නිකුතුවක් සකස් කර තිබීම තුලින් ජනමාධ්‍යවේදීන් අතර වැරදි අර්ථකතන මතු නොවීමට මෙන්ම ඔවුන්ගේ ප්‍රසාදය දිනා ගැනීමටද හැකියාව ලැබිණි.
- නිවැරදි මාධ්‍යවේදීන් තෝරා ගැනීම තුලින් හොඳ මාධ්‍ය ආවරණයක් ලබා ගත හැක.
- සමාජ ජාල මෙන්ම මුද්‍රිත මාධ්‍ය භාවිතා කිරීම තුලින් පුළුල් කණ්ඩායමක් වෙත පිවිසිය හැක. උදාහරණයක් ලෙස අම්පාර කණ්ඩායම ෆේස්බුක් මෙන්ම ප්‍රාදේශීය පුවත් පතක් වන ‘The Tamil Mirror’ තුලින්ද මාධ්‍ය ආවරණයක් ලබා ගන්නා ලදී.
- ‘‘*උග්‍ර සහ නිදන්ගත- ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේ ආගමික ප්‍රචණ්ඩත්වය*’’ යන පර්යේෂණ වාර්තාව තුලින්ද ආගමික නිදහස වෙනුවෙන් මාධ්‍යයට කල හැකි කාර්ය භාරයද එය රජය මගින් නියාමනය හෝ වාරණය නොවිය යුත්තක් බවද පැහැදිලි කරයි.

*‘‘... මෙය ආරක්ෂා කල යුතුයි. අනෙක් මාධ්‍යයන් වෙත ඒකාධිපති බලයේ පීඩනය යෙදෙන කල මෙහි අඩුව ලෙහෙසියෙන් පිරවිය නොහැකිය. ඒ අනුව බලන කල ආගමික නිදහස සහ මාධ්‍යයේ නිදහස එකට එක්ව පවතී.’’*[7]

---

[7] ගුණතිලක. G, 2015. උග්‍ර සහ නිදන්ගත- ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේ ආගමික ප්‍රචණ්ඩත්වය. පි 55

**පිළිගත් ව්‍යවහාරයන්**

මාධ්‍යයන් සමඟ කටයුතු කිරීමට පහත කරුණු අපට වැදගත් වේ

- ක්ෂේත්‍රයේ නිවැරදි පුද්ගලයන් හඳුනා ගැනීම. තමන්ට කටයුතු කිරීමට හැකි නිවැරදි මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන හඳුනා ගෙන පැහැදිලි මාධ්‍ය ආවරණයක් ලබා ගැනීමට කටයුතු කිරීම සහ එමගින් වැරදි අර්ථකතන මතු වීමට ඇති ඉඩ මඟ හරවා ගැනීම.
- කලින් පිලියෙල කර ගත් මාධ්‍ය නිකුතුවක් පවත්වා ගැනීම වාර්තාකරණයට පහසු වේ.
- එක් එක් ප්‍රජාවේ සිටින පුද්ගලයන්ට ෆේස්බුක් සහ ට්විටර් වැනි මාධ්‍ය ජාල භාවිතා කිරීමට ඇති හැකියාව අවබෝධ කර ගැනීම සහ ඔවුන්ගේ එම හැකියාවන් වැඩි දියුණු කිරීමට උපකාර කිරීම.

**මාධ්‍යය සහභාගී කරවා ගැනීම**

**පිළිගත් ව්‍යවහාරයන් සඳහා උදාහරණ**

'ශ්‍රී ලංකාව තුල ආගමික සහජීවනය ප්‍රවර්ධනය' ව්‍යාපෘතිය තුලදී සහභාගිවන්නන් අතර සම්බන්ධය පවත්වා ගැනීමට ෆේස්බුක් භාවිත කෙරුණු අතර පසුව එය පුළුල් කණ්ඩායමක් වෙත නිරාවරණය කෙරිණි. මෙහිදී ෆේස්බුක් තුල එක් එක් කණ්ඩායම් සිදු කල ක්‍රියාකාරකම් ඇමිණුම් ගත කල අතර තවත් සමහර දෙනා ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍යද මේ සඳහා භාවිතා කළහ.

## අන්තර් ආගමික හමුවන් සංවිධානයට අදහස් සහ උපාය මාර්ග

මෙම ව්‍යාපෘතිය තුල ලද අත්දැකීම් තුලින් ICES සහ Equitas ආයතනය අන්තර් ආගමික හමුවන් සාර්ථකව පැවැත්වීම සඳහා සැලකිය යුතු අතිරේක අදහස් සහ උපාය මාර්ග මෙසේ දක්වා ඇත.

- සියලුම ආගම් වලට ගරු කිරීම සහ කිසිම ආගමක වත් පිළිවෙතකට අනෙකට වඩා ප්‍රමුඛතාවයක් ලබා නොදීම. ඒ තුලින් ඔබ සියලු දෙන අතර සමානාත්මතාවය තහවුරු කරන අතර ඔවුන්ගේ ආත්මාභිමනය සහ අන්තර්ග්‍රාහීබව තහවුරු කරවයි.
- මෙම හමුවන් සඳහා කටයුතු සලස්වන විට එක් එක් ආගමික වත් පිළිවෙත් පිලිබඳ සැලකිල්ලට ගැනීම අතිශය වැදගත්ය.
  - එක් එක් ආගමික ප්‍රජාවන්ගේ ආහාර සිමාවන් පිලිබඳ සැලකිල්ලට ගත යුතුය. උදාහරණයක් ලෙසට හින්දු ආගමික ප්‍රජාව බොහෝ විට නිර්මාංශ ආහාර වැළඳීමට ප්‍රියමනාපයක් දක්වන අතර මුස්ලිම් ජාතිකයන් හලාල් ආහාරවලට නැඹුරු වීමක් දක්වයි.
  - සැසි වාරයන් සකස් කරන විට ආගමික වත් පිළිවෙත් සැලකිල්ලට ගත යුතුය. බෞද්ධ ගරු කටයුතු ස්වාමින් වහන්සේලා දහවල් දොළහට දානය වළඳන අතර මුස්ලිම් ජාතිකයන් යාච්ඤාවල යෙදී ආහාර ගනු ලබයි.
  - ක්‍රියාකාරකම් සඳහා සියලු ආගමික ප්‍රජාවන්ට පහසු දිනයක් තෝරා ගැනීම පිළිබඳවද අවධානය යොමු කල යුතුය. මේ සඳහා ප්‍රජාවේ සාමාජිකයන් සහ ආගමික නායකයන් සමඟ සාකච්ඡා කර දිනයක් තෝරා ගැනීම සිදු කල හැකිය. ( ඉරු දින කිතුනු බැතිමතුන්ට අපහසු වන අතර පොහෝ දිනයන්හිදී බෞද්ධාගමිකයන්ට සහභාගී වීම අපහසු විය හැක)
  - කාලය, අවකාශය සහ සංවිධාන කටයුතු සියලු ආගමික ප්‍රජාවන් අන්තර්ග්‍රාහී වන සේ සිදු කල යුතුය.
- සහභාගිත්ව ප්‍රවේශයේ වැදගත් ලක්ෂණයක් නම් එමගින් විවධ ජන වර්ග, සංස්කෘතික කණ්ඩායම් වලට අයත් පුද්ගලයන් සියලු දෙනා එක්ව එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට හැකි වීමයි. මෙම ක්‍රියාවලිය පහසු කරවීමට හැකි මාර්ගයක් නම් සංවාදයන්ට අදාළ මාර්ගෝපදේශනයන් අනුව ක්‍රියාකිරීමයි. මෙහිදී කණ්ඩායම් ගැටළුකාරී තත්වයන් ඇති විය හැකි අවස්ථාවන් හඳුනාගෙන ඒ අනුව මාර්ගෝපදේශනයන් සකස් කර යුතුය. මේ ආකාරයෙන් මාර්ගෝපදේශනයක් සකස් වූ විට සහභාගී වන්නන්ට ස්ව අදහස් ප්‍රකාශ කිරීමට සුරක්ෂිත වටපිටාවක් පවතින බවට නිරායාසයෙන්ම හැඟෙනු ඇත .
  - ඇසීම සහ අනෙක කියන දෙයට සවන් දීම
  - පහත කිරීමෙන් වැලකීම (තමන්ව හෝ අනෙක් අයව)
  - සියලු දෙනාටම කතා කිරීමට අවස්ථාවක් ලබා දීම
- **අනෙකාගේ අවශ්‍යතාවයන්ට ගරු කිරීම, විශේෂයෙන්ම පෞද්ගලිකත්වයට.** ක්‍රියාකාරකම් අතරතුරදී ඡායාරූප හෝ වීඩියෝ කිරීම් සිදු වන්නේ නම් ඒ සඳහා සහභාගී වන්නන්ගේ අවසරය කලින් ඉල්ලා සිටීම. සමූහ ඡායාරූපයක් ගන්නේ නම් මෙයට එක් එක් අයගෙන් වෙන වෙනම අවසරය ඉල්ලා සිටීමට හෝ ක්‍රියාකාරකම් වලට පෙර සටහන් පත්‍රයක් මඟින් අවසරය ඉල්ලා සිටීම කල හැක.

ක්‍රියාකාරකම් සඳහා භාවිත කල **සියලුම තොරතුරු ජාතික භාෂාවන්ට පරිවර්තනය කිරීම.** (ශ්‍රී ලංකාවේ නම් මෙය සිංහල සහ දමිල වේ)

**විවිධ ආගමික ස්ථාන වල ක්‍රියාකාරකම් සංවිධානය කිරීම** සහභාගී වන්නන්ගේ අත්දැකීම් වැඩි කිරීමට හේතු වේ. මෙයින් අදහස් කරන්නේ සියලුම දෙනාට ඇතුළු වීමට අවසරය සහිත සහ සහභාගී වීමට හැකි ස්ථාන වල පමණක් මේවා සංවිධානය කල යුතු බවයි. උදාහරණයක් ලෙසට සමහර ආගමික ස්ථාන වලට කාන්තාවන්ට ඇතුළු වන්නට අවසර නොමැති අතර එබඳු ස්ථාන කිසිසේත් මෙවැනි ක්‍රියාකාරකම් පැවැත්වීමට සුදුසු නොවේ.



## ප්‍රජාවන් තුල සිදු කල ව්‍යාපෘතීන් හි සාරාංශයන්

**අම්පාර කණ්ඩායම**

ඉලක්කය

අන්තවාදී කණ්ඩායම් විසින් ඇති කරන ආගමික ගැටුම් වලට මුහුණ දීමට ප්‍රජාවන් බල ගැන්වීම

ක්‍රියාකාරකම්

ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ක්‍රියාකාරම් අතරට ආගමික සහජීවන සහ මානව හිමිකම් පිලිබඳ ආගමික පාසල් වල සිසුන්, තරුණ කණ්ඩායම්, ආගමික සහ ප්‍රජා නායකයන්,ගුරුවරුන් සහ රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු 11ක්, ඉදිරියේදී ඇති විය හැකි ගැටුම් අවම කිරීමට අධීක්ෂණ සහ මැදිහත් වීමේ කණ්ඩායම් නිර්මාණය කිරීමට අදාල වැඩමුළු 6ක් ( මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ පහම නියෝජනය කරමින් ප්‍රජා සහ ආගමික නායකයන්, ගුරුවරුන් සහ රාජ්‍ය ආයතන වල නියෝජිතයන් සහභාගී විණි) අයත් වේ.

**කොළඹ කණ්ඩායම**

ඉලක්කය

සියලුම ආගමික ප්‍රජාවන්ට අයත් ළමුන්ට එකිනෙකාගේ ආගමික අදහස් ප්‍රකාශ කිරීම සහ ආගමික වත් පිළිවෙත් අවබෝධ කර ගැනීමට හැකි වීම.

ක්‍රියාකාරකම්

මෙහිදී සිදු කල ක්‍රියාකාරකම් අතරට ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩමුළුවක්, මානව සාරධර්ම ඇගයීම, ආගමික විවිධත්වයට ගරු කිරීම සහ ප්‍රචණ්ඩකාරී නොවන සන්නිවේදනය පිලිබඳ බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ කතෝලික යන ආගම් හතරටම අයත් සිසුන් සම්බන්ධ කර ගත් වැඩමුළු හතරක්, ආගමික විවිධත්වය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීමට ඒකාබද්ධ ක්‍රියාකාරකම් දෙකක් ( මේ අතුරෙන් ළමුන් සහ සිසුන් සමඟින් ආගම් හතරටම අයත් පූජනිය ස්ථාන දැක බලා ගැනීමේ වැඩසටහනක්) යනාදිය අයත් වේ. මෙයට අමතර ව්‍යාපෘතියේ අත්දැකීම් බෙදා හදා ගැනීමට ෆේස්බුක් පිටුවක් ආරම්භ කල අතර පසුව ඡායාරූප සහරාවක් මගින් තම ජයග්‍රහණයන් සැමරීමක් සහ ආගමික අවබෝධය පිලිබඳ පුළුල් කණ්ඩායමක් දැනුවත් කිරීම සිදු කරන ලදී.

**ගාල්ල කණ්ඩායම**

ඉලක්ක

එක් එක් ආගමික ප්‍රජාව අතර අවබෝධය වැඩි දියුණු කිරීම

<u>ක්‍රියාකාරකම්</u>

මේ සඳහා ව්‍යාපෘතිය තුල සිදු කල ක්‍රියාකාරකම් අතර විවිධ ආගමික කණ්ඩායම් වලට අයත් ප්‍රජාව සහභාගී කරවා ගත්, තරුණයන් 100ක් ඉලක්ක කරගත් වැඩමුළු 2 ක්, ගුරුවරු 150ක් පුහුණු කිරීමේ වැඩමුළු 03 ක්, පාසල් ළමුන් 250ක් ඉලක්ක කරගත් වැඩසටහන් 03ක් සහ සෞඛ්‍ය අංශයට අයත් රජයේ නිලධාරීන් 40 ක් ඉලක්ක කරගත් වැඩමුළුවක් යනාදිය අයත් වේ. අවසානයේදී ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රා.ලේ . කොට්ටාශයේ තරුණ කණ්ඩායම්, ආගමික නායකයන්, රාජ්‍ය නිලධාරීන් සහ වෙනත් තනතුරු හොබවන්නන් සමඟ පැවැත්වූ උපදේශන සැසියද විවධ ආගමික කණ්ඩායම් අතර අවබෝධය වැඩි දියුණු කිරීමටත් මානව හිමිකම් ප්‍රවේශය යටතේ එක් එක් ආගමට ගරු කිරීමටත් පිරිස උනන්දු කල පියවරක් වශයෙන් හැඳින්විය හැක.

